# වික්ටෝරියාවේ තනි භාවිත ප්ලාස්ටික් තහනම

Sinhalese | සිංහල



## ප්ලාස්ටික් අපවිත්‍රණය අපගේ පරිසරයට හා වන ජීවීන්ට හානි සිදු කරයි

අපගේ පරිසරයේ අප දකින කැළිකසලවලින් තුනෙන් එකක් තනි භාවිත ප්ලාස්ටික්වලින් සමන්විත වන අතර ඒවා පිරිසිදු කිරීම අපහසු සහ මිල අධික වේ.

බොහෝ විට ඒවා භාවිතා කරන්නේ මිනිත්තු කිහිපයක් සඳහා පමණක් වන අතර ප්‍රතිචක්‍රීකරණය කිරීමට අපහසු විශාල අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය කරයි. මෙමගින් සාම්ප්‍රදායික ප්ලාස්ටික් අයිතම සිදු කරන ආකාරයටම අපගේ පරිසරය දූෂණය කළ හැකිය.

බොහෝ විට කොම්පෝස්ට් කළ හැකි හා දිරාපත් විය හැකි ප්ලාස්ටික් සඳහා තවමත් විශේෂ සැකසුම් අවශ්‍ය වේ. කැළිකසල කළ විට සෑම ආකාරයකම ප්ලාස්ටික් පරිසරයට අහිතකර විය හැකිය.

## සමහර තනි භාවිත ප්ලාස්ටික් දැන් තහනම් කර ඇත

පහත සඳහන් තනි භාවිත ප්ලාස්ටික් අයිතම විකිණීම හෝ සැපයීම වික්ටෝරියාවේ තහනම් කර ඇත:

- ✗ **දියර උරා බීමට භාවිතා කරන ප්ලාස්ටික් බට**
- ✗ **හැඳි ගෑරුප්පු පිහිය ආදිය:** පිහි, ගෑරුප්පු, හැඳි, චොප්ස්ටික්ස් (chopsticks), ස්පෝක්ස් ( sporks), ස්ප්ලේඩ්ස් (splades), ආහාර පික්ස් (food picks) සහ ස්පෝක්ස් ඇතුළුව
- ✗ **පිඟන්**
- ✗ **බීම කැලතීමට යොදා ගන්නා දඬු**
- ✗ **කපු අංකුර කූරු (කොටන් බඩ්ස්)**
- ✗ **ප්‍රසාරිත කරන ලද පොලිස්ටයිරීන් ආහාර සපයන අයිතම හා බීම බහාලුම්:**
  - පිඟන්
  - කෝප්ප
  - භාජන
  - වැසිය හැකි බහාලුම්
  - ආවරණ හෝ පියන්.

තහනම් කරන ලද තනි භාවිත ප්ලාස්ටික් අයිතමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් ප්ලාස්ටික්වලින් සාදා ඇති අතර එය නැවත භාවිතා කළ නොහැක.

මෙම තහනම ජෛවභායනීය, දිරාපත් විය හැකි සහ කොම්පෝස්ට් කළ හැකි ප්ලාස්ටික් සඳහා අදාළ වේ.

නිපදවීමෙන් පසු නැවත භාවිත කළ හැකි අයිතම අවස්ථා කිහිපයකදී එකම අරමුණක් සඳහා භාවිතා කළ යුතු අතර ඒවා නිෂ්පාදකයාගේ වගකීම් සහතිකයක් හෝ වෙනත් ලිඛිත නියෝජනයක් සහිතව සැපයෙනු ලැබේ. ඒවා අවම වශයෙන් වසරක්වත් පවතින පරිදි සැලසුම් කර ඇත.

දියර උරා බීමට භාවිතා කරන ප්ලාස්ටික් බටයක් ඉල්ලා සිටින පුද්ගලකුට හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියා කරන කෙනෙකුට/ආයතනයකට එය ආබාධිතතාවක් හෝ වෛද්‍ය අවශ්‍යතාවක් මත අවශ්‍ය වන්නේ යැයි සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, යමෙකුට තනි භාවිත ප්ලාස්ටික් බීම බට විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ ලබාදීම වරදක් නොවේ.

වැඩි විස්තර සඳහා, **පරිසර ආරක්ෂණ රෙගුලාසි 2021** හි 5.5 කොටස බලන්න.

EPA VICTORIA

VICTORIA State Government

epa.vic.gov.au/plastics

## මෙම තහනම සම්බන්ධ යම් බැහැර කිරීම් තිබේ.

විශේෂිත සෞඛ්‍ය සහ ආරක්ෂිත හේතූන් සඳහා, විකල්පයන් නොමැති නම්, තහනම සම්බන්ධ බැහැර කිරීම් අදාළ වේ.

තනි භාවිත ප්ලාස්ටික් අයිතම භාවිතය සඳහා බැහැර කිරීම් 4 ක් පහත දක්වා ඇත:

- ✓ **විද්‍යාත්මක, වෛද්‍ය, වෝහරක හෝ නීතිය බලාත්මක කිරීමේ අරමුණු සඳහා සිදු කරන ලද** පරීක්ෂණ සඳහා යොදා ගන්නා කපු අංකුර කූරු
- ✓ **කායික හානි හෝ තුවාල වැලැක්වීම සඳහා වන ප්‍රතිශෝධනීය හා මානසික සෞඛ්‍ය මධ්‍යස්ථාන තුළ, අවශ්‍ය වූ විටදී,** භාවිතා කරන හැඳි ගෑරුප්පු පිහිය ආදිය
- ✓ 2024 නොවැම්බර් 1 වැනි දින දක්වා **ප්ලාස්ටික් ඉරි සහිත කඩදාසි හෝ කාඩ්බෝඩ් පිඟන්**
- ✓ 2026 ජනවාරි 1 වැනි දින දක්වා **යන්ත්‍ර ස්වයංක්‍රීය ක්‍රියාවලියක් මගින් ආහාර හෝ බීම ඇසුරුම්වලට ඒකාබද්ධ කරන ලද ඕනෑම තනි භාවිත ප්ලාස්ටික් අයිතමයක්**. උදාහරණයක් ලෙස, යෝගට් බඳුනක ඇතුළත් කර ඇති තනි භාවිත ප්ලාස්ටික් හැන්දක්.

ඔබ රෙගුලාසිවලට අනුකූලව අයිතම භාවිතා කරමින් සිටින බවට ලිඛිත ප්‍රකාශයක් ඔබේ සැපයුම්කරුට ලබා දීමට ඔබ කැමැත්ත දැක්විය හැකිය.

## ඔබ කළ යුතු දේ

මෙම තහනම පහත දැක්වෙන ආයතන ඇතුළුව සියලුම ව්‍යාපාර සහ සංවිධාන සඳහා අදාළ වේ:

- **ලාභ නොලබන සංවිධාන**
- **ක්‍රීඩා සමාජ**
- **පාසල්**
- **වෙනත් සංස්ථාපිත ආයතන**
- **ආපනශාලා, අවන්හල් සහ අනෙකුත් ආහාර අලෙවිසැල්**
- **විවිධ පරිභෝජන ද්‍රව්‍ය පහසුවෙන් මිලදී ගත හැකි වෙළඳසැල්.**

ඉහත ලැයිස්තුගත කර ඇති බැහැර කිරීම් හැර, පහත දේ සිදු කිරීම නීතියට පටහැනි වේ:

- තහනම් කරන ලද තනි භාවිත ප්ලාස්ටික් අයිතම වික්ටෝරියාව තුළ විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ සැපයීම
- තහනම් කරන ලද අයිතම සාදා ඇත්තේ කුමකින් ද යන්න පිළිබඳ අසත්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු සැපයීම.

2023 පෙබරවාරි 1 ට පෙර මිලදී ගත් තහනම් අයිතම තොගයක් ඔබ සතුව ඉතිරිව තිබේ නම්, ඔබට:

- ඔබේ සැපයුම්කරු අමතා අනුකූල වන ප්‍රතිස්ථාපන සඳහා ඔවුන් හුවමාරු හෝ ණය ලබා දෙන්නේ දැයි සොයා බැලීමට හැකිය
- ප්‍රාදේශීය ප්‍රතිචක්‍රීකරණය කරන්නෙකු අමතා ඔවුන්ට විශාල ප්‍රමාණවලින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකිදැයි සොයා බැලීමට හැකිය.

ඔබට මෙම අයිතම ප්‍රතිචක්‍රීකරණ බක්කියකට දැමීමට නොහැකිය.

ව්‍යාපාරවලට තහනම පිළිබඳව තේරුම් ගැනීමට උපකාර කිරීම සඳහා අපි ඔවුන් සමඟ වැඩ කරමින් සිටිමු. අපි දැනටමත් වික්ටෝරියාව පුරා 6,500කට අධික සිල්ලර සහ සත්කාරක ව්‍යාපාර හමුවී ඇත්තෙමු.

අපගේ උත්සාහයන් අපට ලොකුම වෙනස ඇති කළ හැකි ස්ථානයන් වෙත යොමු කරමින්, අනුකූලතාව සඳහා අපි වඩාත් ඉහළ ප්‍රවේශයක් ගන්නෙමු. අපගේ නියාමන මෙවලම් භාවිතා කරන විට, ඒවා ගැටලුව සහ අපේක්ෂිත ප්‍රතිඵලය කෙරෙහි අවධානය යොමු කර ඇති බවට අපි සහතික වෙමු.

වැඩි විස්තර සඳහා, අපගේ **අනුකූලතා සහ බලාත්මක කිරීමේ ප්‍රතිපත්තිය** බලන්න.

ඔබ තහනමට අනුකූල නොවන්නේ නම්, ඔබ ඩොලර් 11,095.20 දක්වා තනි පුද්ගල දඩයකට හෝ ඩොලර් 55,476 දක්වා සංස්ථාගත දඩයකට යටත් විය හැකිය.

මෙම තහනම් එක් එක් ප්‍රාන්තයන් අතර වෙනස් වේ. විටෝරියානු නීතිය වටහා ගැනීම හා එය අනුගමනය කිරීම ඔබේ වගකීම වනු ඇත. ඔබ වික්ටෝරියාවෙන් බැහැරව කටයුතු කරන්නේ නම්, එක් එක් ප්‍රාන්තයේ නීති පරීක්ෂා කර බලන්න.